ඇත්ත කෙටි කතාව

# ලෙඩ වූ මිතුරෙකු බලන්නට ගියෙමි

පාසැල් සමයෙ වැඩිපුරම රස්තියාදු ගහපු කාලෙ තමයි අපොස සාමාන්‍ය පෙළ කරලා, ප්‍රතිඵල එනතෙක් ඇති කාලය. ඒ දවස්වල ඉතින් ගුරුවරුත් වැඩිය අපි ගැන එච්චර හොයන්නෙ නැහැ. ගෙදරින් යන්නෙ ඉස් කෝලෙ යනවයි කියලා. ඉස්කෝලෙ ළඟට ගිහිං යාළුවො එක්ක කොළඹ තැන් තැන්වල රවුම් ගහපු එක තමයි කළේ. ගල්කිස්සෙ මූදෙ නාන්න යනවා. ගැණු ඉස්කෝල ඇරෙන කල් ඒ පැත්තෙ රවුම් ගහනවා. කව්බෝයි සහ හින්දි චිත්‍රපටි එකක් නැර බලනවා. ඒ තමයි ඒ කාලේ අපි කළ ප්‍රධානම දේවල්.


අපිත් එක්ක ඔය වගේ රවුම් ගහපු යාළුවෙක් ටික දවසක් ඉස්කෝලෙ ආවෙ නැහැ. ඒ ළඟ ඉන්න තව ළමයෙකුගෙන් ආරංචි වුණා මැන්ට පැපොල් හැදිලා කියලා. අපි කතාවුණා මිනිහව බලන්න යන්න. පන්තියෙ හැමෝම වගේ ගමනට කැමති වුණාට, යන දවසෙ ආවෙ (මාත් එක්ක) තුන්දෙනයි. අනික් අය හෙමිහිට මග ඇරියා. මොකද ඒ අයට තවම පැපොල් හැදිලා නැහැ.

ඉතින් අපි තුන්දෙනා පන්නිපිටිය පැත්තෙ ඒ ගේ හොයාගෙන බස්වලින් ගියා. එහෙට යනකොට දවල් දොළහට විතර ඇති. යාළුවගෙ අම්ම ඉස්සරහට දුවගෙන ඇවිල්ලා අපිව පිළිගත්තා.

"මේ පුතාලා අපේ ලලිත්ගෙ පන්තියෙ ළමයි වෙන්න ඇති...." කියලා අපිට ඉස්තෝප්පුවෙ ඉඳගන්න කියලා අම්මා ගේ ඇතුළට දිව්වා. විනාඩි දහයකට විතර පස්සෙ අපි තුන්දෙනාව ලෙඩාගෙ කාමරේ ඇතුළට එක්කගෙන ගියා.

මේ ඉන්නෙ යාළුවා අළුත් සරමක් බැනියමක් ඇඳලා. නැගිට ගන්නවත් බැහැ ඇඳේ දිගාවෙලා හිටියෙ. මූණ නිකං පෙනේරයක් වගේ. ඒ තරමට හිල්. කතා කෙරුවෙත් හරි අමාරුවෙන්. ඔය අතරෙ අම්මා ගෙනැල්ල අල්ලපු බිස්කට් පැකට් එකයි, කෙහෙල් ඇවරියයි ඉවර කරලා අපි තේත් බිව්වා.

පැයකට විතර පස්සෙ අපි යන්න නැගිට්ටා. යාළුවගෙන් සමු අරගෙන ඉස්සරහ ආලින්දයට ආපු අපේ ඉස්සරහට අම්මා ආවා. "පුතාලා යන්නද...? ඉන්න අනේ බත් ටිකක් කාලා යන්න..." කියලා කිව්වා. ඒ කාලෙ අපි කාගෙත් සිරිත තමයි තැන නොතැන මොනව වුනත්, කෑමට ආරාධනාවක් ආවොත් කීයටවත් බැහැයි නොකියන ගතිය. ඉතින් අපි ඒ යහපත් ගුණයට අනුව එකිනෙකාගෙ මූණ බලලා හා කියලා ආයි පුටුවල වාඩි වුණා. අම්මා හනික ගේ ඇතුළට දිව්වා.



විනාඩි පහකට විතර පස්සෙ අපිට ඇහුණා බයිසිකලයක් හෙලවෙන හඬක්. හරියට බයිසිකලයක් එළියට ගන්නවා වගේ. සද්දයක්. අපි නිකං එළියෙ බිත්තිය අයිනෙන් ගේ පිටිපස්සට එබිලා බැලුවා. මෙන්න බොලේ අර යාළුවා - පැපොල් හැදිච්ච අමාරු ලෙඩා - බයිසිකලේ හැන්ඩ්ල් එකට සාගත මල්ලකුත් දාගෙන අමාරුවෙන් බයිසිකලේ පැදගෙන පිටිපස්ස පත්තෙන්ම යනවා. අපි ගල්ගීත වෙලා බලං හිටියා.

විනාඩි පහළොවකට විතර පස්සෙ ආපහු කුස්සිය පැත්තෙන් බයිසිකලේ හෙළවෙන හඬ අපට ඇහුණා. ඒ කියන්නෙ මැන් අන්න ආවා. පොඩ්ඩක් එබුණාම දැක්කා, මුරුංග කරල් මුගුණවැන්න මිටියක් වගේ දේවල් එක්ක මල්ලක් සහිත බයිසිකලේ පිටිපස්සෙ බිත්තියට හේත්තු කරනවා.

ටික වෙලාවකින් අපිට ඇහුණා පොල් ගෙඩියක් බිඳින සද්දයක්. වළං හෙලවෙන, පොල්ගාන සද්ද. අම්මා ආයිත් ඉස්සරහට ඇවිල්ලා කිව්වා, " අපි ටිකක් දවල් වෙලා තමයි කන්නෙ... ... පුතාලා ඉන්න.... මම ටක්ගාලා කෑම ලෑස්ති කරනවා " කියලා.

අපිත් හිනාවෙලා ඔළුව වැනුවා. අම්මගෙ මූණ දිහා බැලුවම පෙනුණෙ ඇය ලිපට පිඹ පිඹ ඉඳලා ආ බවයි.

කොහොමත් දවල් දෙක විතර වෙන-කොට බඩවල් පුරවගෙන අපි පාරට බැස්සා. අර යාළුවා කෑමට ආවෙ නෑ. මිනිහා දන්නෙ නෑ එයා බයිසිකලේ යනවා අපි දකින්න ඇති කියලා. අපි කවදාවත් ඒ බව ඇහෙව්වෙත් නෑ.

එදා ඒ ගැන හාස්‍යයක් මිසක් කණගාටුවක් ඇතිවුණේ නෑ. දැන්නම් ඒ සිද්ධිය මතක්වෙන කොට හිතට හරි අමාරුවක් දැනෙනවා. ඒ අම්මා දැන් ජීවතුන් අතර නැතුව ඇති. කොහේ හිටියත් ඇයට පින්සිද්ධ වේවා! ඒ යාළුවා දැන් කොහේ ඉන්නවද නැද්ද කියලා කිසිම ආරංචියකුත් නෑ.

♦ නීතිඥ අනුර හෑගොඩ
London





# මගුල් තුලා නිව් සිස්ටම්

බත් ඉවීමෙ, පපඩම් බැදීමෙ ඉඳලා ලෝකෙ හැම දෙයක්ම වෙනස් වෙලා. එහෙම තමයි ලෝකෙ හැටි! සමහර දේ වෙනස් වෙන්නෙ කල් ගිහිල්ලා. සමහර දේ ක්ෂණිකව වෙනස්වෙනවා. මේ වෙනස්කම් ගැන හිත හිත ඉන්දෙද්දී මට තැපෑලෙන් මංගල ආරාධනා පත්‍රයක් ආවා. මංගලය තියෙන්නෙ ලංකාවෙ හික්කඩුවෙ හෝටලේක. ඒ වෙලාවෙ මට නිකම් කල්පනාවට ආවා, මේ වෙනස්වෙමින් පවතින ලෝකෙ මගුල්තුලා පවා හිතන්න බැරි විදියට නොසෑහෙන්න වෙනස්වෙලා බව.

අද මඟුලක් කියන්නෙ අසීමිත ලෙස මුදල් වියදම් වෙන වැඩක්. මනමාල ජෝඩුවට, ඒ අයගෙ තාත්තලා අම්මලාට. බෙස්ට්මන් හෙවත් යහළුවට. බ්‍රයිඩ්ස් මේඩ් හෙවත් යෙහෙළියට. ඊළඟට තෑගිබෝග අරන් මංගල්ලෙට යන ආරාධිත අමුත්තන්ට. මේ හැමෝන්ටම සල්ලි වියදම් වෙනව නම්, එහෙනම් වාසි කාටද? වාසි මගුල තියන තරු පහේ හෝටලේට.

මේ හෝටල් වලින් තමයි ලංකාවෙ මංගල චාරිත්‍ර වෙනස් කළේ. චාරිත්‍ර විතරක් නෙවෙයි ලංකාවෙ ජනතාවගේ සිතුම් පැතුම් සේරම වෙනස් කළේ. අපේ ජනතාව දැන් හිතන්නෙ ඉස්සර විදියට නෙවෙයි. දැන් ගමක් කියලා දෙයක් ඇත්තෙ නැහැ. සේරම නාගරික වෙලා. දැන් ඒ කාලෙකට ඉස්සර තිබිච්ච මගුල්තුලා හීනයක් වගේ. දැන් කිසි කෙනෙක් තමන්ගෙ ගෙදර කසාද බඳින්නෙ නැහැ. ගෙදරට නෑදෑයො එන්නෙ නැහැ. කාටත් ඕන ලොකු හෝටලේක මගුල ගන්න. නැත්නම් තත්වෙට මදි. මොකද හෝටලේ දැන් ඒ සේරම සපයන නිසා.

පෝරුව, අෂ්ඨක, බෙර, හක්ගෙඩි, නැටුම්, කුකුළා පහන, සේසත්, උඩරට ඇඳුම් ආයිත්තම්, මනමාලිට ඇඳුම් ඇන්දීම, පොටෝකාරයා, වෙඩිං ඇල්බම් එක, මංගල කේක් ගෙඩිය, වෙඩිං කේක් කෑලි, ආරාධනා පත්‍ර මුද්‍රණය කරදීම, ජෝඩුව යන වාහන, කෑම බීම, විතරක් නෙවෙයි, ජෝඩුවට මධුසමය ගත කරන්න කාමරේකුත් හෝටලෙන්ම දෙනවා. දැන් මනමාලිගෙ පැත්තෙන් දෑවැද්දක් දෙන සිරිත නැතිවෙලා ගිහින් වුනත්, ඉල්ලුව නම්, හෝටලෙන් දෑවැද්දත් දේවිය කියලා මට හිතෙනවා. හෝටලේ බාරගන්නවා මේ සේරම අඩංගු පැකේජ් එකක්.

මේවට අවශ්‍ය එකම දේ සල්ලි. ඒවා ඉස්සර වගේ සීයෙන්, දාහෙන් බෑ. ලක්ෂ, දස ලක්ෂ සහ කෝටි වලින් වියදම් වෙනවා. මේ සේරම දේ ඉෂ්ටවෙලා, කසාද බැඳලා, ඒ සේරම වැඩ ඉවර-වෙන කොට මිනිස්සුන්ට අතේ සතේ නැතුව, වැලේ වැල් නැතුව යනවා. ඒත් හිත හදාගන්නවා. හැමදාම නැනේ. ජීවිතේට එක සැරයයි නේ බඳින්නෙ, මඟුලක් ගන්නෙ කියලා.

ඉස්සර මඟුල් පෝරුව ගැහුවෙ ගෙදර සාලෙ. දැන් ඒක හෝටලේ පිට්ටනියෙ. මම දැක්ක සමහර මූද අයිනෙ තියන හෝටල්වල පෝරුව වැල්ලෙ හයිකරන්නෙ. අෂ්ඨක ජයමංගල ගාථා කියන්නෙ වැල්ලට ගිහිං. දැන් උඩරට නැටුම් වලින් ලංකාවෙ වැඩක් ගන්නෙ පෙරහැර කාලෙට නෙවෙයි, මගුල් නැකැත් තියන දාට හෝටලේ ඇතුළෙයි, එළියෙයි නටලා.

අලුත්ම මෝස්තරේ තමයි හෝටලේ ඇතුළටම අලි ගෙන්වන එක. එක වෙඩිං එකකදි අලියා හොඬවැලෙන් අරන් මනමාලිටයි, මනමාලයටයි ගස් ලබු කෑල්ලක් කවන්නයි ලෑස්ති කරලා තිබුණේ. නමුත් වුණේ, අලිය මුල් කෑල්ල මනමාලිට කවලා, ඊළඟ කෑල්ල අලියා කෑවා. අලියා හිතන්න ඇති මනමාලයා අලියයි කියලා. මේ වැඩිපුර ගණනක් කොටාගන්න හෝටලේ කරන සූත්තර වැඩ. අපේ සිංහළ මිනිස්සු අන්දවන්න හරි ලේසියි.

හෝටලේ කෑමට අය කිරීම අඩුම ගණන රුපියල් 3000යි **Per Head** ඒ කියන්නෙ එක ඔළුවකට, සාමාන්‍ය විදියට කිව්වොත් එක්කෙනෙකුට කෑමට අයකරන ගණනයි ඒ. අමුත්තො 300 කට ආරාධනා කරනව නම්, තුන්දාහ, තුන්සීයෙන් වැඩි කරලා බලන්න. මේ නිසා මංගල ආරාධනා පත්‍ර දෙනකොට දැන් අමුත්තන්ට කියනවා, "අනේ පොඩි ළමයි එක්කන් එන්න එපා" කියලා. ඉස්සර ගෙදරක හැමෝටම බුලත් දීලා ආරාධනා කළා. දැන් ඒවා නෑ. ආව නම් පොඩි අයටත් තුන්දාහ ගණනේ තමයි කෑම. එතකොට කෑම බිල තවත් නගිනවා.

මේ සේරම ඉවර වෙන කොට ගමේ බාසාවෙන් කියනවා නම් අතේ තිබුණු තුට්ටු දෙක හිඳිලා. ණයවෙන තත්වෙට වැටෙනවා. මඟුලෙ රහ දැනෙන්නේ එතකොටයි. මෙතෙන්දි මට මතක්වෙනවා මිල්ටන් පෙරේරා ගායනා කළ පරණ ප්‍රේම ගීත-යක්. " ඔබේ අත රැගෙන මහපාරේ..... සිහා කෑමේ වුවද එනවා....." හලෝ! ඒ කියමන දැන් ඇත්තක්ම වුනා නේද?

♦ වෙලේගෙදර රාළ London





# 'සිත්තරු ඇඳි රූ' චිත්‍ර ප්‍රදර්ශනය

ඉකුත් දෙසැම්බර් මස **6,7,8,** යන දිනවල කොළඹ කලා භවනේ ජාතික චිත්‍රකතා පදනම මගින් පැවැත්වූ සිත්තරු ඇඳි රූ දැවැන්ත චිත්‍ර ප්‍රදර්ශනය අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා අතින් මුල් දින යේද, ගරු අගමැති දිමු ජය රත්න මැතිතුමන් අතින් අවසන් දිනයේත් විවෘත විය.

චිත්‍ර ප්‍රදර්ශනයකට මින්පෙර කිසිදු දිනයක නොපැමිණි පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇතුළු අති විශාල චිත්‍රකතා ලෝලී ජනතාවක් දිවයිනේ සතර දිග් භාගයෙන්ම මෙම චිත්‍ර ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි අතර චිත්‍ර දහසකට අධික ප්‍රමාණයක්ද ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කොට තිබුණි.

එහිදී ගරු ජනාධිපතිතුමා **තලංගම ජයසිංහ** චිත්‍ර ශිල්පියා විසින් ඉදිරිපත් කොට තිබූ චිත්‍ර නරඹමින් ඔහු හා සුහද පිළිසඳරක යෙදුණු අයුරුය මේ.

( ඡායාරූප - සුදත් සිල්වා )

කාටූන් ඇතුළු චිත්‍රකලාව කෙරෙහි ශ්‍රීලංකාවේ පාසැල් සිසුන්ගේත් වැඩිහිටියන්ගේත් මහත් උනන්දුවක් ඇතිවීමට මූලික හේතුව වූයේ **70** දශකයේ දී ලංකාවේ ආරම්භ කරන ලද **සිත්තර, සතුට, මධුර** ආදී චිත්‍රකලා පත්‍රයි. ඒ පත්‍ර නිසා අළුත් තරුණ සිත්තරුන් විශාල සංඛ්‍යාවක් අප රටේ බිහිවූයේ ය. අද ඒ බොහෝ දෙනෙක් නමගිය එමෙන්ම කුසලතාවෙන් පිරි චිත්‍ර ශිල්පීහු වෙති.